# ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

## අධ්‍යාපන අමාත්‍යාංශය

**නිපුණතා සංවර්ධන, වෘත්තිය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය**

## කර්මාන්ත පුහුණුව අවසන් කළ උපාධි සහ ඩිප්ලෝමා අපේක්ෂකයන්ගේ අවසන් ඇගයීම් පරීක්ෂණ මණ්ඩල සඳහා බාහිර සම්පත්දායක සංචිතයට සුදුසුකම් ලත් ප්‍රවීන වෘත්තිකයන් ලියාපදිංචි කිරීම

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA) 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පණතේ බලතල ප්‍රකාරව විශ්ව විද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන වල සිසුන් සඳහා කර්මාන්තගත පුහුණුව (Industrial Training) ලබාදීම සිදු කරනු ලබයි.

ඉහත අධ්‍යාපන ආයතනවල සිසුන්ගේ කර්මාන්තගත පුහුණුව අවසානයේදී පවත්වනු ලබන ඇගයීම් කටයුතු අප අධිකාරිය සහ එම අධ්‍යාපන ආයතන වලින් සමන්විත ඇගයීම් පරීක්ෂණ කමිටු මඟින් සිදුකරනු ලබයි. එම ඇගයීම් කමිටු සඳහා අවශ්‍යතාවය අනුව අප අධිකාරිය නියෝජනය කරමින් සහභාගි වීමට මෙහි දක්වා ඇති සුදුසුකම් සපුරන ප්‍රවීන වෘත්තිකයන්ගෙන් සමන්විත බාහිර ඇගයීම්කරුවන්ගේ සංචිතයේ දෙවන අදියර සෑදීමට සැලසුම් කර ඇත.

ඇගයීම්කරුවෙකු වශයෙන් සහභාගි වීමට කැමැත්ත දක්වන ප්‍රවීන වෘත්තිකයන් මේ සඳහා අයදුම් කරන මෙන් ඉල්ලා සිටිමි.

| අනු අංකය | අධ්‍යාපන / වෘත්තිය සුදුසුකම | කර්මාන්තගත අත්දැකීම් |
|---|---|---|
| 01 | අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය සමඟ පශ්චාත් උපාධියක් හදාරා තිබීම<br>සහ<br>පිළිගත් වෘත්තිය ආයතනයක ආවසරික සාමාජිකත්වය ලබා තිබීම අතිරේක සුදුසුකමකි. | අදාළ ක්ෂේත්‍රයේ අවම වසර 5ක විධායක ශ්‍රේණියේ පළපුරුද්ද |
| 02 | අදාළ ක්ෂේත්‍රයේ ජාතික ඩිප්ලෝමා, උසස් ජාතික ඩිප්ලෝමා, හා ඊට සමාන NVQ 6 මට්ටමේ සුදුසුකම<br>සහ<br>පිළිගත් වෘත්තිය ආයතනයක ආවසරික සාමාජිකත්වය ලබා තිබීම අතිරේක සුදුසුකමකි. | අදාළ ක්ෂේත්‍රයේ මධ්‍යම මට්ටමේ කළමණාකරුවෙකු ලෙස අවම වසර 15ක පළපුරුද්ද |

ඉහත කමිටු සඳහා සහභාගි වීමේදී දෛනික දීමනාවක් ගෙවීමට කටයුතු කෙරේ. තවද, මෙම ඇගයීම් කටයුතු බස්නාහිර පළාතට අමතරව දිවයිනේ අනෙකුත් පළාත් වලද සිදු කරනු ලබයි.

<u>අයදුම්පත් ලබාගැනීම සහ අයදුම් කිරීම</u>

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ **www.naita.gov.lk** වෙබ් අඩවියෙන් අයදුම්පත සහ ඉල්ලුම් කළ යුතු විෂය ක්ෂේත්‍රයන්ගේ ලැයිස්තුව බාගත කර ගත හැකිය. **නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය, අධ්‍යාපන, වෘත්තිය පළපුරුද්ද සනාථ කෙරෙන සහතික වල සහතික කරන ලද පිටපත් සමග සහකාර අධ්‍යක්ෂ (විශේෂ කර්මාන්ත පුහුණු), ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය යන ලිපිනයට 2024.05.28 දිනට පෙර** ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"බාහිර සම්පත්දායක සංචිතය සඳහා ලියාපදිංචි වීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත විද්‍යුත් තැපෑලෙන් එවන්නේ නම් ඒ සමඟ අධ්‍යාපන, වෘත්තිය පළපුරුද්ද සනාථ කෙරෙන සහතික වල ස්කෑන් පිටපත් **extapnaitasitd@gmail.com** යන විද්‍යුත් තැපෑලට යොමු කළ හැක.

**තොරතුරු ලබාගත හැකි දුරකතන අංක - එස්.ජී.ටී. අනුරාධා / ඉෂාරා චන්ද්‍රපාල**

**General: 011-2888782 - 5 (Ext: 600 | 602) Direct: 011-2885796**

සභාපති
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය